## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
## ඇබෑර්තු
# ආහාරපාන සහායක තනතුර

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින **"ආහාරපාන සහායක"** තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් **2021 අප්‍රේල් මස 30** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"ආහාරපාන සහායක"** යනුවෙන් සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය)

**1. වැටුප් පරිමාණය:**
2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 28,250-9x 300/10x 330/3 x 380-35,390 /- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාල අවම ආරම්භක දළ මාසික වැටුප රු. 62,000.00 පමණ වේ).

**2. අධ්‍යාපන සුදුසුකම්:**
සිංහල හෝ දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ද, ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයන්ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වී සිටීම.

**3. වෘත්තීය සුදුසුකම්:**
ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) / ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA)/ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ (VTA) හෝ ඒ හා සමාන වෘත්තීය පුහුණු ආයතනයක පාඨමාලා කාලය වසරකට නොඅඩු මූලික භෝජනාගාර සේවා පාඨමාලාවක් / ආහාරපාන සේවා පාඨමාලාවක් හදාරා එය සාර්ථකව නිමකොට තිබීම.

**4. පළපුරුද්ද:**
තරු පංතියේ හෝටලයක/පිළිගත් ආයතනයක භෝජනාගාර සේවක/ ආහාරපාන සහායක තනතුරක වසර දෙකකට නොඅඩු කාලයක් සේවය කර තිබීම.

**5. වයස් සීමාව :**
අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 22 ට නො අඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

**6. බඳවා ගැනීමේ ක්‍රමය :**
ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**7. සේවා නියමයන් හා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

**8.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය.
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික.
(ඇ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

**9.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**10.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
2021 අප්‍රේල් මස 09 වැනි දින.

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
## ආදර්ශ අයදුම්පත්‍රය
# ආහාරපාන සහායක තනතුර

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්):- ....................................................................
....................................................................
....................................................................
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම (සිංහලෙන්) :- ....................................................................
....................................................................
....................................................................
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- *(Mr/Mrs /Miss)* ....................................
....................................................................
....................................................................
....................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය:- | | | | | | | | | | | | |

03. (අ) පෞද්ගලික ලිපිනය :-....................................................................
....................................................................
....................................................................
දුරකථන අංකය :- | | | | | | | | | | |
(ආ) කාර්යාලයීය ලිපිනය :-....................................................................
....................................................................
....................................................................
දුරකථන අංකය:- | | | | | | | | | | |
(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය
පෞද්ගලික ☐ කාර්යාලයීය ☐

04. (1) උපන් දිනය:- වර්ෂය : ............... මාසය : ............. දිනය : ..............
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
(11) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස:- වර්ෂය : ........ මාසය : ........ දිනය : ........

05. විවාහක/ අවිවාහක බව :- (විවාහක/ අවිවාහක)

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :- (ස්ත්‍රී/ පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :- (ඔව්/නැත)

08. අධ්‍යාපන සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

| විභාගය | විෂයය | සාමාර්ථයන් | සමත්වූ වර්ෂය |
|---|---|---|---|
| අ.පො.ස (සා/පෙළ) | සිංහල/ දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)
....................................................................
....................................................................
....................................................................

10. වෙනත් සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතුය)
....................................................................
....................................................................
....................................................................

11. පළපුරුද්ද :- (සහතික පිටපත් ඇමිණිය යුතුය)

| ආයතනය | තනතුර | සේවා කාලය |
|---|---|---|
| | | |
| | | |
| | | |

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර
(අ) ආයතනයේ නම හා ලිපිනය :-....................................................................
(ආ) දැනට දරණ තනතුර:-....................................................................
(ඇ) මුල් පත්වීමේ දිනය:-....................................................................
(ඈ) මාසික මූලික වැටුප :-....................................................................
(ඉ) දීමනා :-....................................................................
(ඊ) දළ වැටුප:-....................................................................

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න:-
....................................................................

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? (ඔව්/නැත)
එසේ නම් එම විස්තර සඳහන් කරන්න.
....................................................................

ම විසින් මෙම අයදුම්පතහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

දිනය :- .......................................... ..........................................................
අයදුම්කරුගේ අත්සන

Source: parliament.lk (2021.04.09)